INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

2017 මැයි 19

**මළවුන් අපරාධකරුවන් කොට ජීවත් වන්නවුන් බිය ගැන්වීම**

ජොහැන්නස්බර්ග්: සිවිල් යුද්ධයේදී මළවුන්ගේ නම් ගල් පුවරු වල කොටා මුල්ලිවයික්කාලේදී සිහිපත් කිරීමට තහනමක් පැනවූ පොලිසිය ඉන් අනතුරුව දෙමළ ක්‍රියාධරයන්ට සහ ඔවුන්ගේ ඥාතීන්ට තර්ජනය කිරීම වහාම අත්හිටුවීමට පියවර ගන්නා ලෙස සත්‍යය සහ යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ඉල්ලා සිටියි.

එම ගල් පුවරු අවට කිසිදු යාඥා මෙහෙයක් පැවැත්වීම බදාදා මුලතිව් අධිකරණය විසින් දෙසතියකට තහනම් කරන ලද්දේ එවැනි කටයුත්තක් ජාතික ආරක්ෂාව, සාමය සහ ඒකාග්‍රතාව අනතුරේ හෙළනු ඇතැයි යන්න පදනම් කොටගෙනය.

ගලේ කෙටූ නම් අතර හිටපු එල්ටීටීඊ සාමාජිකයන්ද සඳහන් වනු ඇති බවට අධිකරණය අවධානය යොමු කළ බවද වාර්තාවේ.

“වැළපීම විශ්ව අයිතියකි; තම දරුවන් එල්ටීටීඊ සාමාජිකයන් වුවද -මෙහිදී අපි ඒ බවක් නොදන්නෙමු- ඔවුන් වෙනුවෙන් මෑණිවරුන් හා පියවරුන් ශෝක වීම වලක්වා ලිය නොහැක්කකි,” යි ITJP විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය. “මෙය මරණයෙන් අනතුරුවත් දෙමළ ජනයා අපරාධකරුවන් බවට පත් කිරීමකි. නිතර දෙවේලේ සංහිඳියාව ගැන කතා කරන රටකම මෙය සිදුවීම අතිශයින්ම විකාර සහගතය.”

අනුස්මරණ ගල් පුවරු සම්බන්ධයෙන් ජේසු නිකායික එලිල් රාජේන්ද්‍රම් දේවගැති තුමා අද දෙවැනි වතාවටත් පොලිසියට කැඳවා ප්‍රශ්න කර තිබුනි. පොලිස්පති වරයාගේ අණ පරිදි වවුනියාව පොලිස් ස්ථානයේදී ප්‍රශ්න කරනු ලැබීමෙන් අනතුරුව සිංහල කතා නොකරන එම පියතුමාට සිංහලෙන් ලියැවුනු ප්‍රකාශයකට අත්සන් කරන්නට සිදුවී තිබේ. ඔහුගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් යාපනයේ සිටින ඔහුගේ දෙමාපියන්ගෙන් ප්‍රශ්න කළ පොලිස් නිලධාරීන් ඔවුන් බිය ගැන්වීමට උත්සාහ කර ඇත. මළවුන්ගේ නම් ලැයිස්තුවක් ලබා දෙන ලෙස එලිල් පියතුමාට බල කොට ඔහු ත්‍රස්තවාදයට ආධාර කරන්නේ දැයි ප්‍රශ්න කර තිබේ.

“මෙය පැහැදිලිවම පැමිණිලිකරුවන් බිය වැද්දීමක් විනා අපක්ෂපාතී පරීක්ෂණ පැවැත්වීමක් නොවේ,” යි යැස්මින් සූකා පැවසුවාය. “පොලිසිය එලිල් පියතුමාගේ දෙමාපියන්ගෙන් ප්‍රශ්න කරන තරම් දුර යාම අයුත්තකි,” යි ඇය වැඩිදුරටත් පැවසුවාය, “මෙම පළිගැනීමේ අරමුණ ඔහුගේ ඥාතීන් බිය ගැන්වීම සහ සියලු දෙමළ ක්‍රියාධාරීන් අතර භීතියේ කම්පනය ඇති කිරීම බව පැහැදිලිය. ඊටත් වඩා මෙය පොලිස්පති

අඤින් කෙරෙන්නකි. මේ බියගැන්වීම් සහ පලිගැනීම් නතර කරන්නට මැදිහත් වන ලෙස අපි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමින් සහ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් වරයාගේ කාර්යාලයෙන් ඉල්ලා සිටිමු. මන්දයත්, වැළපීම යනු මිනිසත් කමයි.”

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT